දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax )0112692913

විද්‍යුත් තැපැල )postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ්අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය )
எனது இல ) NA/06/16/2018
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி ) 2018.12. 12
Date )

# සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
# சுகாதார,போசணைமற்றும் சுதேசவைத்தியஅமைச்சு
# Ministry of Health, Nutrition& Indigenous Medicine

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී ලංකා ජාතික රෝහල)
ශික්ෂණ රෝහල්/ මහ රෝහල් අධ්‍යක්ෂවරුන් හා
මූලික රෝහල් වල වෛද්‍ය අධිකාරීන්,
ඇතුළු සියලුම ආයතන ප්‍රධානීන් වෙත.

**කුරුණෑගල සහ කෑගල්ල ශික්ෂණ රෝහල් සඳහා ස්ථාන මාරු කැඳවීම - 2018**

කුරුණෑගල හා කෑගල්ල ශික්ෂණ රෝහල් සඳහා හෙද /හෙදි නිලධාරීන්ට ස්ථාන මාරු ලබා දීමට අදාලව නිකුත් කරන ලද අංක 01/22/2018 හා 2018.05.11 දිනැති අයදුම්පත් කැඳවීමේ නිවේදනය හා බැඳේ.

02. ඒ අනුව ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කරන ලද නිලධාරීන් අතුරින් මාරු මණ්ඩලය හරහා ස්ථාන මාරු නිර්දේශ වී ඇති හෙද නිලධාරීන්ගේ හා නිර්දේශ වී නොමැති හෙද නිලධාරීන්ගේ තොරතුරු ඇතුලත් නාම ලේඛනය මේ සමඟ වේ.

03. වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය 2018.03.31 දිනට වසර 04 ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරීන්ගේ හා අපේක්ෂා රෝහල මහරගම, ජාතික බෝවන රෝග විද්‍යායතනය අංගොඩ, ජාතික මානසික සෞඛ්‍ය විද්‍යායතනය, හා වැලිසර ළය රෝහල යන සේවා ස්ථාන වල 2018.03.31 දිනට වසර 02 ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරීන්ගේ මුල් පත්වීම් දිනට ජ්‍යෙෂ්ඨත්වය සලකා බලා ස්ථාන මාරු නිර්දේශ ලබා දෙන ලදී. මෙහිදී මීට පෙර කුරුණෑගල හා කෑගල්ල රෝහල් සඳහා ස්ථාන මාරු ඉල්ලා, පුරප්පාඩු නොමැති වීම හේතුවෙන් වෙනත් රෝහලකට ස්ථාන මාරු මත වාර්තා කරන ලද නිලධාරීන්ගේ පෙර සේවා ස්ථානයේ සේවා කාලය සැලකිල්ලට ගන්නා ලදී.

04. මෙම ස්ථාන මාරු නිර්දේශ සම්බන්ධව යම් පාර්ශවයකට විරෝධතා හෝ නිවැරදි කිරීම් හෝ අභියාචනා හෝ පවතී නම් එම විරෝධතා / නිවැරදි කිරීම් හා අභියාචනා 2018.12.26 දිනට පෙර ආයතන ප්‍රධානියා මඟින් විධිමත්ව පහත ලිපිනයට දැනුම් දීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි. අභියාචනා ඉදිරිපත් කලයුතු ආකෘතිය ඇමුණුම 01 මඟින් දැක්වේ.

වී.සී.ද සිල්වා
අධ්‍යක්ෂ (පාලන) 01
සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
අංක 385,
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත
කොළඹ 10.

05. අදාල විරෝධතා / නිවැරදි කිරීම් හා අභියාචනා සම්බන්ධව ස්ථාන මාරු සමාලෝචන කමිටුවේ නිර්දේශ ද සැකිල්ලට ගෙන කුරුණෑගල හා කෑගල්ල රෝහල් සම්බන්ධව ස්ථාන මාරු නියෝග ඇතුලත් අවසන් ලේඛනය නිකුත් කරනු ලැබේ.

06. එම ලේඛනය සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශ වෙබ් අඩවියෙහි (www.health.gov.lk) පල කරනු ලබන අතර, විරෝධතා / නිවැරදි කිරීම් හා අභියාචනා සම්බන්ධ තීරණය පෞද්ගලිකව කිසිම නිලධාරියෙකුට දැනුම් දෙනු නොලැබේ.

ඩොනල්ඩ් මුරගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

ඩොනල්ඩ් මුරගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) 02
ලේකම් වෙනුවට,
සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය